**ශීර්ෂය - 22 පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය.**

---

## 1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 1.1 <u>තත්වාගණනය කළ මතය</u>

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 අගෝස්තු 27 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 අගෝස්තු 15 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 <u>තත්වාගණනය කළ මතය සඳහා පදනම</u>

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 <u>මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම</u>

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර

පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 <u>මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම</u>

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම් ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 <u>වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව</u>

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය විසින් ඉකුත් වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම් ඉදිරිපත් කිරීම

ආයතනය විසින් නියමිත දිනයට පහත සඳහන් ගිණුම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **වාර්ෂික මූල්‍ය ප්‍රකාශන**<br>2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 28 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එය මාස 03 ක ප්‍රමාදයකින් පසු 2019 මැයි 31 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | අදාල චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | රා.ගි.චක්‍රලේඛ 267/2018 අනුව, ප්‍රථම වරට මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී, අප කාර්යාලයේ ගණකාධිකාරිවරයෙකුද නොමැති බැවින්, විවිධ ගැටළුවලට මුහුණ පෑමට සිදුවිය. එම නිසා එම ගැටළු නිරාකරණය කරමින් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී යම් ප්‍රමාදයක් ඇති විය. |

### 1.6.2 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධාවලට අනුකූල නොවීම

2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 267/2018 චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව හඳුන්වා දී ඇති ආකෘතින් අනුව මූල්‍ය ප්‍රකාශන වල අගයන් හා තොරතුරු ඇතුළත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ ඒසීඒ-එෆ් ආකෘතිය යටතේ වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් යටතේ අත්තිකාරම් ලැබීම් ලෙස දැක්විය යුතු රු.771,682 ක වටිනාකම ඇතුළත් කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වේ. | රාජ්‍ය ගිණුම් ච.ලේ. 267/2018 අනුව මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී සිදුව ඇති විවිධ අතපසුවීම් හා අඩුපාඩු හඳුනාගෙන ඉදිරි වර්ෂයන් සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී හැකිතාක් දුරට නිවැරදිව සකස් කිරීමට කටයුතු කරනු ඇත. |

### 1.6.3 ගිණුම්කරණ අඩුපාඩු

(අ) **ආදායම් නොවන ලැබීම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශනවල ඒසීඒ-2 ආකෘතියෙහි සඳහන් මු.රෙ.66/69 මාරුකිරීම් යටතේ උප එකතුව සහ මුළු එකතුවේ අගය ශුන්‍ය විය යුතු වුවත්, එහි රු.1,257,500 ක් සහ රු.1,940,500 ක් යන අගයන් දක්වා තිබුණි. | මු.රෙ.66/69 මාරුකිරීම් යටතේ උප එකතුව සහ මුළු එකතුවේ අගය ශුන්‍ය විය යුතුවේ. | එක්සෙල් පැතුරුම් පත්වල සූත්‍ර මඟින් අදාල සංඛ්‍යාමය අගයන්වල ඓක්‍යය යෙදීමේදී සිදුවී ඇති දෝෂයකින් මෙම වෙනස ඇති වී ඇත. |

(ආ) **තැන්පතු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 565 ප්‍රකාරව පොදු තැන්පත් ගිණුමක් පවත්වා නොතිබූ බැවින් කාර්යාලය වෙත 2018 වර්ෂයේ ලැබුණු රු.10,155 මුදල් සහ රු.8,455 ගෙවීම් වලට සම්බන්ධ සටහන් මුදල් පොතේ පමණක් ඇතුළත් කර තිබුණි. | මුදල් රෙගුලාසි 565 ප්‍රකාරව පොදු තැන්පත් ගිණුම පවත්වා ගත යුතුවේ. | ඉදිරියේදී පොදු තැන්පත් ගිණුම සම්බන්ධයෙන් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරන බව දන්වා සිටිමි. |

(ඇ) **දේපල පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| **(i)** | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය (ඒසීඒ-6 ආකෘතිය) 2018 දෙසැම්බර් 31 දිනට දේපළ පිරියත හා උපකරණ වල අගය රු.10,476,145 ක් වූ නමුත්, එදිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ එම අගය රු.10,556,145 ක් ලෙස දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි අගයන් ඇතුළත් කළ යුතුවේ. | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ, වර්ෂයේ අපහරණය කරන ලද වත්කම්වල අගය ගැලපීමට පෙර අගය දක්වා ඇත. එම නිසා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ, එම අගය රු.80,000 ක් වැඩියෙන් පෙන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | සමාලෝචිත වර්ෂය තුළ මාරුකිරීම් මගින්, තක්සේරු වටිනාකම්වල එකතුව රු.91,500 ක අගයකට වත්කම් අපහරණය කර තිබුණු අතර, එම වත්කම්වල පිරිවැය වෙනුවට මූල්‍ය ප්‍රකාශවල ඒසීඒ-6 ආකෘතිය යටතේ වූ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ අපහරණයන් යටතේ රු.80,000 ක මුදලක් අඩුකර තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි අගයන් ඇතුළත් කළ යුතුවේ. | මූල්‍ය තත්තවය පිළිබඳ ප්‍රකාශයේ අපහරනය යටතේ රු.80,000 ක් ලෙස දක්වා ඇති අගය රු.91,500 ක් ලෙස නිවැරදි විය යුතුය. |
| **(iii)** | සමාලෝචිත වර්ෂය සඳහා සිගාස් වැඩසටහන අනුව වත්කම් ශේෂයන් පිළියෙල කර නොමැති බැවින් සහ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරණු ලබන වත්කම් වාර්තාව (ASSEST REPORT) කාර්යාලය විසින් ලබාගෙන නොමැති බැවින් එම වත්කම් ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවල ඒසීඒ-6 ආකෘතිය අනුව මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයෙහි දක්වා ඇති වත්කම් ශේෂයන් සමඟ සැසඳීමට නොහැකි විය. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරණු ලබන වත්කම් වාර්තාව සමඟ මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශය අනුව පිළියෙල කරන ලද වත්කම් ශේෂයන් සැසඳිය යුතුවේ. | අප කාර්යාලයේ සිගාස් වැඩ සටහන 2019 වර්ෂයේ සිට ආරම්භ කරන ලද අතර එහි ඇති වී ඇති දෝෂමය තත්ත්වයක් හේතුවෙන් වත්කම් පිළිබඳ තොරතුරු ඇතුළත් කිරීමට නොහැකි වී ඇත. එම නිසා වත්කම් වාර්තාව ලබා ගැනීමට නොහැකි විය. |
| **(iv)** | 2018 ජනවාරි 01 දිනට සහ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල (ඒසීඒ-6 ආකෘතියෙහි) මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබූ කේත අංක 61122 වෙනත් යන්ත්‍ර හා උපකරණ ශේෂය සහ ස්ථාවර වත්කම් ලේඛණයේ ඇතුළත් එම ශේෂය අතර 2018 ජනවාරි 01 දිනට රු.963,327 ක වෙනසක් සහ 2018 දෙසැම්බර් 31 දිනට රු.926,882 ක වෙනසක් පැවතුණි. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි අගයන් ඇතුළත් කළ යුතුවේ. | මෙම ආයතනයේ ස්ථාවර වත්කම් වල මිලදී ගත් වටිනාකම් නිවැරදි මූලාශ්‍ර සහිතව ඇත්තේ 2008 ජනවාරි 01 න් පසු මිලදී ගත් වත්කම් වල පමණි. ඊට පෙර මිලදී ගත් වත්කම් වල වටිනාකම් 2014 වර්ෂයේදී තක්සේරු කර ඇත. නමුත් 2008 වර්ෂයට පෙර සිට වාර්ෂික විසර්ජන ගිණුමේ පැවති මුළු වත්කම් වටිනාකම් ශේෂයට ඉදිරි වර්ෂ වලදී, වර්ෂය තුළ මිලදී ගත් හා අපහරණය කළ වත්කම් වල වටිනාකම් ගලපා ශේෂය ඉදිරියට ගෙන ගොස් ඇත. එහිදී 2008 වර්ෂයට පෙර මිලදී ගත් වත්කම් වල මිලදී ගත් වටිනාකම් ඇතුළත්ව ඇති බැවින් මෙම ශේෂය නිවැරදි නොවන |

බව පැහැදිලි වේ. ඒ අනුව මෙම ශේෂය කඩිනමින් නිවැරදි කිරීමට කටයුතු යොදා ඇත.

**(ඇ)** <u>**ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**</u>

ආයතනය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම |
|---|---|---|
| **ලැබෙන චෙක්පත්, මුදල් ඇණවුම් ආදිය සඳහා වූ ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 451 ප්‍රකාර චෙක්පත්, මුදල් ඇනවුම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 451 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව ජී.ඒ.එම්.83 දරන පෝර්මය පරිදි ලැබෙන චෙක්පත්, මුදල් ඇණවුම් සටහන් කර ගැනිමට හැකිවන පරිදි ලේඛනයක් පවත්වා ගත යුතුවේ. | අතපසු වීමකින් අදාල ලේඛනයේ සටහන් කර නොමැත. |

**2.** <u>**මූල්‍ය සමාලෝචනය**</u>

**2.1** <u>**බැරකම් හා බැඳීම්වලට එළඹීම**</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.4 ඡේදය අනුව, සටහන් අංක iii යටතේ වන බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය භාණ්ඩාගාරය විසින් එක් එක් වියදම් ශීර්ෂවලට අදාලව නිකුත් කරනු ලබන බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය සමඟ එකඟ විය යුතු අතර එලෙස වාර්තා නොකළ කිසිදු බැඳීමක් හෝ බැරකමක් පෙර වර්ෂයේ | මූල්‍ය ප්‍රකාශනවල සටහන-(iii) යටතේ දක්වා තිබුණු බැඳීම් හා බැරකම්, භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද බැඳීම් හා බැරකම් ප්‍රකාශය සමඟ එකඟ විය යුතු අතර, එලෙස වාර්තා නොකළ කිසිදු බැඳීමක් හෝ බැරකමක්, පෙර වර්ෂයේ වියදමක් ලෙස 2019 වර්ෂයේදී නිරවුල් නොකළ යුතු වේ. | භාණ්ඩාගාරය විසින් සකස් කරනු ලබන බැරකම් පිළිබඳ ප්‍රකාශයේ අදාල බැරකම් නොදැක්වීම හේතුවෙන් මෙම ගැටළුව ඇති වී ඇති බව අපේක්ෂා කරන අතර, ඉදිරියේදී මේ පිළිබඳ සොයා බැලීමට සටහන් කර ගනිමි. |

| | | | |
|---|---|---|---|
| | වියදමක් ලෙස 2019 වර්ෂයේදී නිරවුල් නොකල යුතුය. එසේ වුවත්, 2018 මූල්‍ය ප්‍රකාශනවල බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයෙහි (සටහන iii) දක්වා තිබුණු රු.389,837 ක බැරකම් මුදලක් භාණ්ඩාගාරය විසින් එක් එක් වියදම් ශීර්ෂවලට අදාලව නිකුත් කරනු ලබන බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයෙහි දක්වා නොතිබියදී 2019 වර්ෂයේදී නිරවුල් කර තිබුණි. | | |
| (ආ) | 2019 පෙබරවාරි 21 දින වවුචර් අංක 35 මගින් ගෙවා තිබූ කාර්යාල ගොඩනැගිල්ලේ 2018 දෙසැම්බර් හිග කුලී රු.110,875 ක් 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබූ බැරකම් පිළිබඳ ප්‍රකාශයෙහි (සටහන iv හි) සහ බැරකම් ලේඛණයෙහි දක්වා නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබූ බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයෙහි (සටහන iv) සහ බැරකම් ලේඛනයෙහි ඇතුළත් කළ යුතු වේ. | අතපසුවීමකින් එය බැරකම් ලේඛනයේ හා බැරකම් පිළිබඳ ප්‍රකාශයෙහි සටහන් කර නොමැත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

**3.1.1.** කොමසාරිස් කාර්යාලයේ කාර්ය සාධනය පිළිබඳව සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක තොරතුරු පහත දැක්වේ.

| | විස්තරය | 2018 | 2017 | 2016 | 2015 | 2014 |
|---|---|---|---|---|---|---|
| (අ) | **පරීක්ෂණ පැවැත්වීමට නියමිත පැමිණිලි** | | | | | |
| | (i) පසුගිය වර්ෂයෙන් ඉදිරියට ගෙන එන ලද පැමිණිලි | 616 | 457 | 459 | 421 | 527 |
| | (ii)වර්ෂය තුළ ලැබුණු පැමිණිලි | 1588 | 1380 | 1422 | 1120 | 1087 |
| | (iii)පරීක්ෂණ පැවැත්වීමට නියමිත මුළු පැමිණිලි | 2204 | 1837 | 1881 | 1541 | 1614 |
| (ආ) | **ඉහත පැමිණිලි සම්බන්ධව කොමසාරිස් කාර්යාලයේ වර්තමාන ප්‍රගතිය පහත දැක්වේ.** | | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| **(i).**පරීක්ෂණ සිදුකරන ලද සහ අන්තර් පාර්ශව විමර්ෂන වලින් අනතුරුව වාර්තා කරන ලද සංඛ්‍යාව | 16 | 24 | 29 | 27 | 26 |
| **(ii).**සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීම පිණිස අදාල ආයතනය වෙත යොමු කරන ලද පැමිණිලි සංඛ්‍යාව | 40 | 47 | 35 | 28 | 100 |
| **(iii).**අදාල ආයතනවලින් වාර්තා කැඳවා එය පැමිණිලිකරුට දැන්වීමෙන් පසු ඉදිරි පියවර ගැනීම නවතාලු පැමිණිලි සංඛ්‍යාව | 379 | 318 | 425 | 388 | 237 |
| **(iv).**වාර්තා කැඳවීමෙන් පසු ඉල්ලීම් ඉටු වී ඇති පැමිණිලි සංඛ්‍යාව | 109 | 103 | 110 | - | - |
| **(v).**පරීක්ෂණ සිදුකිරීමෙන් තොරව සමථයට පත්කරන ලද පැමිණිලි සංඛ්‍යාව | 451 | 69 | 100 | 73 | 224 |
| **(vi).**ලඝු ලෙස කටයුතු අවසන් කරන ලද පැමිණිලි සංඛ්‍යාව | 730 | 660 | 725 | 566 | 606 |
| | ------- | ------- | ------- | ------- | ------ |
| පරික්ෂණ පැවැත්වීමට සහ වාර්තා කිරීමට නියමිත ඉතිරි පැමිණිලි සංඛ්‍යාව | 479<br>==== | 616<br>==== | 457<br>==== | 459<br>==== | 421<br>=== |

## 3.2 සැලැසුම් කිරීම

### 3.2.1 ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) අනුමත ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබුණි. | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මෙම කාර්යාලයේ ප්‍රධාන අරමුණ ලාභ ඉපයීම නොවන බැවින් අදාල පනතේ සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කරගත් ක්‍රියාකාරකම් ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට පියවර ගෙන ඇති බව දන්වමි. |

### 3.2.2 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 අනුව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 අනුව කටයුතු කළ යුතු වේ. | වාර්ෂිකව සීමිත මිලදී ගැනීම් ප්‍රමාණයක්, කෙටි කාලීනව ඇතිවන අවශ්‍යතාවයන් අනුව සිදු වන බැවින් එක් වර්ෂයක් සඳහා පමණක් වන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කරනු |

| | | | |
|---|---|---|---|
| | අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | | ලැබේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම, ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ 4.2.1 සඳහන් ආකෘතිය ප්‍රකාරව පිළියෙල කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 අනුව කටයුතු කළ යුතු වේ. | කාර්යාලයට මිලදී ගනු ලබන්නේ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අධිකාරී සීමාව තුළ මිලදී ගත හැකි අඩු වටිනාකම් සහිත භාණ්ඩ පමණි. ඒවා බොහෝ විට වෙළෙඳපොළ මිල සැඳහුම් ක්‍රමය යටතේ මිලදී ගන්නා බැවින් ප්‍රසම්පාදන සැලැස්ම, ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ 4.2.1 හි ආකෘතිය ප්‍රකාරව පිළියෙල කිරීමට අපහසු වේ. |
| (ඇ) | 2016 අගෝස්තු 02 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 02/2016 හි 4.2 ඡේදයේ (ii) අනුව, සියළු ඇස්තමේන්තු ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව සකස් කරන ලද ප්‍රසම්පාදන සැලසුම්වලට අනුකූල විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තු ප්‍රතිපාදනය රු.1,500,000 ක් ද, ප්‍රසම්පාදන සැලැස්ම අනුව අපේක්ෂිත වියදම රු.2,917,000 ක්ද, වූයෙන් ඇස්තමේන්තු ප්‍රතිපාදනය රු.1,417,000 කින් ඉක්මවා සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | 2018 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමට පෙර, 2018 වර්ෂය සඳහා වියදම් ඇස්තමේන්තුව ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබුණි. එම නිසා, ඔබගේ ඡේදයේ සඳහන් පරිදි විෂමතාවයන් ඇති වී තිබූ අතර ඉදිරියේදී එබඳු විෂමතාවයන් හැකිතාක් අවම වන පරිදි ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමට කටයුතු යොදමි. |

## 3.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පෙත්සම් කටයුතු කළමනාකරණය සඳහා මෘදුකාංග පද්ධතියක් ස්ථාපනය කිරීමට රු.500,000 ක් හා කාර්යාලය පරිගණක ජාලගත කිරීම සඳහා රු.150,000 ක් 2018 වර්ෂයට වෙන්කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය තුළ උක්ත කාර්යයන් අවසන් කර නොතිබුණි. | සැලසුම් කළ පරිදි කටයුතු කළ යුතු වේ. | ප්‍රතිපාදන නොමැතිවීම ඇතුළු විවිධ නොවැලැක්විය හැකි කරුණු හේතුවෙන් මෘදුකාංග පද්ධතියක් ස්ථාපනය කිරීම සහ පරිගණක ජාලගත කිරීම ප්‍රමාදවී ඇත. මෙම වර්ෂයට උක්ත කාර්යයන් සඳහා ප්‍රතිපාදන ලැබීමෙන් පසුව එම කාර්යයන් අවසන් කිරීමට පියවර ගත හැකිවේ. |

## 3.4 ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය තුළ සිදු කිරීමට අපේක්ෂිත ප්‍රසම්පාදනයන් ලෙස ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුළත් කර තිබූ රු.622,000 ක මිලදී ගැනීම් වර්ෂය තුළදී සිදු කර නොතිබුණි. | සැලසුම් කළ පරිදි කටයුතු කළ යුතුවේ. | 2018 වර්ෂය සඳහා ලබාගෙන තිබූ ප්‍රතිපාදන ප්‍රමාණය අනුව වර්ෂය තුළ මිලදී ගනු ලැබුවේ මිලදී ගත යුතුව තිබූ අත්‍යාවශ්‍යම කාර්යාල උපකරණ වේ. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුළත් කර නොතිබුණු රු.128,355 ක් වටිනා උපකරණ වර්ෂය තුළ මිලදී ගෙන තිබුණි. | සැලසුම් කළ පරිදි කටයුතු කළ යුතුවේ. | නව ඇඟිලි සලකුණු යන්ත්‍රයක්, පරිගණක මේස හා UPS උපකරණ 06 ක් වැනි හදිසියේ ඇති වූ අවශ්‍යතාවයන් නිසා ප්‍රසම්පාදන සැලැස්මෙන් බැහැරව මිලදී ගැනීම් සිදු විය. |

## 3.5 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු 2018 වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව 2019 අගෝස්තු 09 දින වන විටත් සභාගත කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මේ සඳහා අමාත්‍ය මණ්ඩල තීරණය ලැබීමෙන් පසු ජනාධිපති ලේකම් කාර්යාලය මගින් ඉදිරියේදී අප වෙත දැනුම් දීමෙන් පසු අවශ්‍ය සංයුක්ත තැටි (CD) හා දෘඩ පිටපත් මුද්‍රණය කර පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලය වෙත යැවීමට පියවර ගන්නා බව දන්වා සිටිමි. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) අනුමත සේවක සංඛ්‍යාව 32 ක් හා තථ්‍ය සේවක සංඛ්‍යාව 23 ක් වූ බැවින් පුරප්පාඩු 09 ක් පැවතුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. | 2018 වර්ෂයේදී පුරප්පාඩු තනතුරු 04 ක පිරවීම සිදුවූ අතර 2019 වර්ෂයේ එක් තනතුරක පුරප්පාඩුව පුරවා ඇත. |
| (ආ) වර්ෂ ගණනාවක සිට පුරප්පාඩුව පවතින පරිපාලන නිලධාරී (පැමිණිලි) තනතුර සඳහා නිලධාරියෙකු ලබා දෙන ලෙස ඉල්ලා 2017 මාර්තු 29 දින ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිපියක් යොමු කර තිබූ නමුත් එම පුරප්පාඩුව එලෙසම පැවතුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. | පුරප්පාඩුව පවතින පරිපාලන නිලධාරී තනතුර පුරවා දෙන ලෙස 2017 මාර්තු 29 දින ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිපියකින් දන්වා ඇති අතර, මේ වන තුරු එම ඉල්ලීම ඉටු කර නොමැත. |
| (ඇ) 2018 වර්ෂය තුළ කාර්යාලයේ ස්ථිර සේවයේ නියුතු නිලධාරීන් 23 ක් | කාර්ය මණ්ඩලය පුහුණු කළ යුතු වේ. | කාර්ය මණ්ඩලයේ නිලධාරීන්ගෙන් පුහුණු පාඨමාලා සඳහා ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් නොවීම හා සහභාගී වූ පුහුණු |

සිටියද, එයින් 03 දෙනෙකු පමණක් වර්ෂය තුළ පුහුණුවීම් සඳහා යොමු කර තිබුණි.

පාඨමාලා ද නොමිලයේ පවත්වනු ලැබූ ඒවා විය.